# ශ්‍රී ලංකාවට රුසියාව



## සමීප කළ 'ඔරුවල බන්දු'

■ මල්රේණු කස්තුරිරත්න

වෙරළු ගසකට කථා කළ හැකි නම් මොන තරම් දේ පවසනු ඇතිද?
මිනිසුන් ගැන.......... යුගය ගැන.......... සමාජය ගැන.............
ළෙන්ගතුකම ගැන......
මේ සියල්ල කථා කරන්නට සිටි වෙරළු ගස අද නැත. වෙරළු ගස හා ළබැඳි මිනිසා ද අද නැත. 'ඔරුවල බන්දු' නම් වූ විද්‍යාර්ථියා දකින්නට පෙර මා දුටුවේ පල්ලෙවෙල, කැන්දලන්දේ පිහිටි ඔහු ගේ නිවස ඉදිරිපිට වැවුණු රුස්ස වෙරළු ගසයි. අනතුරු ව අප ඉදිරියට ආ ඔහු ඒ ගස පිළිබඳ කතාව කී විලාසය මට අද පවා ගෙන එනුයේ ඉමහත් ආස්වාදයකි. ඒ 'කතාන්දරය' තුළ ඔරුවල බන්දු නමැති මානව හිතවාදියා මම පළමු වරට හඳුනා ගතිමි.
යකඩ ගේට්ටුවලින් ආරක්ෂා වූ සුවිසල් මන්දිරයක මිදුලේ, මහේශාක්‍ය ලෙස වැඩුණු වෙරළු ගසකින් වැටුණු වෙරළු ගෙඩි කන්නට පාසල් දරුවන් පැමිණි විටෙක, නිවෙස් හිමි ඉහළ පාංතික කාන්තාවක විසින් ඔවුන් පළවා හරින විටෙක, ඔරුවල බන්දු කුඩා දරුවන් වෙනුවෙන් පෙනී සිට කළ අරගලය ඔහු අපට විස්තර කළේ ය. සිය ගෙවත්තේ වෙරළු ගසක් සිටුවා එහි එල මුළු ගමට ම බෙදා දීමට තරම් දිරියක්, සවියක් හා අධිෂ්ඨානයක් මෙම සංවේදී මිනිසා තුළ විය. ඇති නැති පරතරය නැති කරන්නට සිය පැන හැමදාමත් මෙහෙයවූ ඔහු, උක්ත ක්‍රියාව තුළ ප්‍රායෝගික ව ඔප්පු කොට පෙන්වූයේ ද සෝවියට් දේශයෙන් තමා උකහා ගත් ඒ උත්තරීතර දර්ශනය නොවන්නේ ද?
එදා මෙදා තුර ඔරුවල බන්දු නම් වූ ප්‍රාඥයා සමග, මා තරම් වාද විවාද කළ අයකු තවත් නැති තරම් ය. ඉතා ළෙන්ගතු වූත්, සුහදශීලී වූත්, ආදරණීය වූත් ගරුත්වයකින් මා ඔහුගේ මතය හා එකඟ වූ අවස්ථා මෙන් ම ඔහු ගේ අදහස් නිෂේධනය කළ අවස්ථා ද බොහෝ ඇත. අද ඔරුවල බන්දු නැත. එහෙත් මේ සියල්ල ආස්වාදනීය මතකයක් සෙයින් මා සිත තුළ සදාකාලික ව තැන්පත් වී ඇත.
දශක හත හමාරක් තරම් කාලයක් ජීවත් වූ ඔරුවල බන්දු ගේ 'ළමා විය' වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම ළමා වියකි. කුඩා කාලය ගැන කියන 'විමල් මල්ලී' සහ ගැටවර විය ගැන කියා පාන 'ඉඳි අකුලට පැන්න කාලෙ' කෘතිවලින් හමු වන විමල් ගේ දඟකාරකම් පුන පුනා රස විඳිය හැකිය. අනතුරු ව ඔහු 'ජනතාව අතර' සැරිසරන්නට පටන් ගත්තේ ය. එදා සෝවියට් දේශය විසින් ශ්‍රී ලංකාවේ ශිෂ්‍යයන් හට ප්‍රදානය කරන ලද 'අෂ්ටපරිෂ්කාර සහිත මහා දානය' යයි විරුදාවලී ලද ශිෂ්‍යත්වය ලබා ගත් පිරිස අතර සිටි කෙළිලොල්, කටකාර තරුණයා රුසියානු ජන විඥ්ඥාණය පරතෙරට හදාළේය. බොහෝ සිසුන් නොලැබූ ආකාරයේ පුදුමාකාර අත්දැකීම් සම්භාරයක් ලබා ගන්නට හැම තත්පරයක් ම ගත කළ ඔරුවල බන්දු යළි මව්බිමට පැමිණ කළ පළමුවැනි කාර්යය වූයේ එම ඓතිහාසික පස් අවුරුද්ද පිළිබඳ අත්දැකීම් ශ්‍රී ලංකාවේ පාඨකයන් හා බෙදා හදා ගනිමින් 'පස් අවුරුද්ද ' නම් වූ ජනප්‍රිය හා සම්මාන ලාභී නවකතාව ලිවීමයි. ශ්‍රී ලාංකික ජනතාව තුළ රුසියාව පිළිබඳ ව සොයන්නට, බලන්නට කුහුල වැඩුයේත්, ඔවුන් රුසියාවට හා රුසියානුවන්ට ආදරය කරන්නට පෙළඹවූයේත් මේ පස් අවුරුද්ද

නවකතාව බවට විවාදයක් නැත. එසේ ම ඔරුවල බන්දු විසින් ලියන ලද පනහකට අධික ග්‍රන්ථ අතර ඔහු ගේ නිර්ව්‍යාජ මෙන් ම හිතට එකඟව ලියන ලද හොඳම කෘතිය ලෙස මා දකින්නේ ද මෙම පස් අවුරුද්ද නවකතාවයි. මන්ද යත්, ඔරුවල බන්දු නම් වූ නිර්ව්‍යාජ මිනිසා එම පස් අවුරුද්ද තුළ ජීවත්වී, එම පස් අවුරුද්ද පුරාවට ලබන ලද පන්නරය ඇතිව, "අමතක නොවේ මට මැරුණත් රුසියාව" කියන්නට තරම් සෝවියට් දේශයට ආදරය කරන්නට පදනම දැමූ පස් අවුරුද්දක මතකය 'පස් අවුරුද්ද' නවකතාව තුළින් එළි දැක්වෙන බැවිනි.
ඔහු ලුමුම්බා මිත්‍රත්ව සරසවියේ මුල්ම ශිෂ්‍ය කණ්ඩායමේ සාමාජිකයෙකි. ඔහු සමග එකට අධ්‍යාපනය හා ජීවිතය හැදෑරූ විප්ලවවාදීහු, සාහිත්‍යධරයෝ, දේශපාලනඥයෝ ආදී ශ්‍රේෂ්ඨ විද්‍යාර්ථීහු ලොව පුරා විසිරී පැතිරී සිටිති. ඔරුවල බන්දු ගේ 'සරසවි' බවට පත් වූයේ ලුමුම්බා මිත්‍රත්ව සරසවිය පමණක් ම නොවේ. ඔරුවලින් පටන් ගෙන එතෙර මෙතෙර කරක් ගසා අවසානයේ පල්ලෙවෙල කැන්දලන්දෙන් ජීවිතය අවසන් කරන තුරු ම, තමා ජීවත් වූ හා ඇසුරු කළ මුළු මහත් ජනසමාජය ම - හෙවත්, මුළු මහත් විශ්වය ම ඔරුවල බන්දු ගේ විශ්වවිද්‍යාල විය. එහිදී තමා විසින් උපයා ගන්නා ලද බොහෝ දේ නොබියව කියන්නට ඔහු ගේ දිව මෙන්ම, නොබියව ලියන්නට ඔහු ගේ අත ද බලවත් විය. සිය පෑන දෙපිට කැපෙන මුවහත් අසිපතකට වඩා බලසම්පන්න බව ඔහු නිතර ඔප්පු කළේය. පොදු ජනතාව වෙත හදවතින්ම ළං වූ ඔහු වැදෙන තැනකට වැදෙන්නට ලියූ බොහෝ කවි වස්කවිවලට වඩා ප්‍රබල විය. ජාතික ප්‍රශ්න පිළිබඳ ව ඔහු ලියූ, කියූ දේ පුන පුනා ලියන්නට අවශ්‍ය නැත. මන්ද යත්, ශ්‍රී ලංකාවේ පුවත්පත් කියවන කිසිම කෙනෙකුට ඔරුවල බන්දු හෝ ඔහු විසින් ලියන ලද කවි හෝ ආගන්තුක නොවන බැවිනි.

ලියෙව් තෝල්ස්තෝයි නම් වූ ශ්‍රේෂ්ඨ රුසියානු ලේඛකයා පිළිබඳ ව ඔරුවල බන්දු තුළ වූයේ විශේෂ පැහැදීමකි. තෝල්ස්තෝයි ගැන මෙන් ම, ඔහුගේ ගම ගැන ද හෙතෙම කථා කළේ මහත් අභිරුචියකිනි. "යාස්නයා පොල්යානා" හි තෝල්ස්තෝයි ගේ ජීවිතයට සමීප දුම්රියපොළ සේ ම, පල්ලෙවෙල නමින් ඔරුවල බන්දුට ද සමීප දුම්රියපොළක් විය. ඔහු අවසන් ගමන් ගිය පුවත මට දැනගන්නට ලැබුණේ 'යාස්නයා පොල්යානා' හි තෝල්ස්තෝයි පඬිවරයා ගේ ගොවිපොළ පිහිටි පරිශ්‍රයේ සිටියදී ය. එවිට මට නිතැතින් ම සිහිපත් වූයේ ඔරුවල බන්දු සිය ගෙවත්තේ, සිය දහදිය මහන්සියෙන් වවා තිබූ කුඩා ගොවිපොළ හා තෝල්ස්තෝයි පඬිවරයා කළ අයුරින් ම ගොවිපොළෙන් ලැබෙන අස්වැන්න රැගෙන පාර අයිනේ සිට ගැමියන්ට බෙදා දෙන ආකාරයත් ය. මියයන තුරාම ඔහු සිය කාය ශක්තිය පිළිබඳ ව උද්දාම විය.
අත්කොට සුදු කමිසයත්, සුදු සරමත් ඇඳුම කර ගත්, වත, හිස මෙන් ම හදවත ද සුදු, ඔරුවල බන්දු ගේ පැසුණු පෙනුම හා පැසුණු දැනුමත්, ජන කවියකු තුළ දක්නට ලැබෙන නිර්ව්‍යාජ කවිබසත් හිටිවන කවියට ළබැඳි - කවි මඩු හා සබැඳි අයට සැමදා සිහිපත් වනු ඇත.
රුසියානු භාෂාව ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත කිරීමෙහිලා ඔරුවල බන්දු ගෙන් වූ මෙහෙවර කිසිවකුට කිසිදිනක මකාලිය නොහේ. ශ්‍රී ලංකාවේ රුසියානු භාෂාව ඉගැන්වීමෙහි පුරෝගාමියා ලෙස ඔරුවල බන්දු ඉතිහාසයට එක් වේ. කොළඹ නාලන්දයේ සිසුන්ට රුසියානු 'අ' යන්න කියා දුන් ගුරුතුමා පසු කාලයේ කැලණිය විශ්වවිද්‍යාලයේ රුසියානු භාෂාව ඉගැන්වීමෙහි පුරෝගාමියා විය. රුසියානු භාෂාවත්, රුසියානු සාහිත්‍යයත් ඔහු වෙතින් හදාරණ ලද, ශ්‍රී ලාංකික ශිෂ්‍යයන් බොහෝ දෙනෙකු සෝවියට් දේශයෙහි ශිෂ්‍යත්වලාභීන් ලෙස අධ්‍යාපනය ලැබුවේ ඔරුවල බන්දු ගේ මග පෙන්වීම නිසා ය.
රුසියානු සාහිත්‍යය මෙරට පාඨකයා වෙත සමීප කරවීමේ පුරෝගාමියා වශයෙන් දැඳිගම වී. රුළිගු පරිවර්තන කාර්යයෙහි අසමසමයකු වන්නේ යම් සේ ද, එසේ ම රුසියාව පිළිබඳ ව, රුසියානු ජන ජීවිතය පිළිබඳ ව මෙරට පාඨකයා දැනුවත් කරන ස්වතන්ත්‍ර නිර්මාණකරුවකු වශයෙන් ඔරුවල බන්දු වැදගත් වේ. රුසියාව ඇසුරු කළ අයගෙන් රුසියාව ගැන - රුසියානුවන් ගැන ඔරුවල බන්දු පමණ ලියුවෙක් තවත් නැති තරම් ය.
රුසියාවේ සිංහල භාෂාව ව්‍යාප්ත කිරීමෙහි ලා විප්ලවීය කාර්ය භාරයක් ඉටු කළ බෙල්කොවිච් නම් වූ ශ්‍රේෂ්ඨ රුසියානු ප්‍රාඥයෙක් සිටියේ ය. රුසියාවේ දී බෙල්කොවිච් විසින් සිංහල භාෂාවට කරන ලද සේවාව තරම් ම සේවාවක් ශ්‍රී ලංකාවේ රුසියානු භාෂාව ව්‍යාප්ත කිරීමෙහි ලා ඔරුවල බන්දු ප්‍රාඥයා අතින් ඉටු වී ඇත. එම සුවිසල් කාර්යභාරය නිසි ඇගයීමකට මෙතෙක් ලක් වී නැති අතර, ඒ පිළිබඳ ව සිතන්නට එතුමාගෙන් රුසියානු භාෂාව උගත් ශිෂ්‍යයන්ට කාලය එළඹ ඇති බව කිව යුතුය.

ඔරුවල බන්දු ඇයෙන් සමුගෙන වසරක් පිරෙන දා ඔහු පිළිබඳ මතක සටහනක් තැබීම අපගේ යුතුකමක් හා වගකීමක් වන්නේ ය. ඔහු අවසන් ගමන් ගිය දා ඔහු වෙනුවෙන් ලියැවී තිබුණු පහත සඳහන් කවියෙන් - වෙරළු ගසින් පටන් ගත් මෙම සටහන අවසන් කරනු කැමැත්තෙමි.

**දොරකඩ වෙරළු ගස මත විහඟ**
**යා හැකි වූ හෙයින් සත් සයුරු පසු**
**පෙරදින ළබැඳි පස් අවුරුද්ද සිහි**
**'රතු රට' හඬයි රතු ගිනි සිළුව**

**සුසුමට**
**කොට**
**- කොට**
**නිවුනට**